# කොළඹ ජාතික කෞතුකාගාරය පිළිබඳව විමර්ශනයක්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***එල්.එල්.ඒ.කේ.ජයතිස්ස [1]***
***ජේ. එම්. සුධර්මාවතී;[2]***

**සංක්ෂේපය**

ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්ද කෝෂයට අනුව කෞතුකාගාරයක් යනු "මානව වර්ගයාගේ අද්විතීය ඓතිහාසික සාධක, ස්වාභාවික උරුමයන්, ලලිත කලාවන් හා තාක්ෂණික නිර්මාණ එක් රැස් කිරීම, තැන්පත් කිරීම, ලේඛනගත කිරීම සහ ප්‍රදර්ශනය කිරීම කරනු ලබන්නා වූ ස්ථානයකි." කොළඹ ජාතික කෞතුකාගාරය යනු හුදෙක් කෞතුක භාණ්ඩ හා පෞරාණික කෘති එකතුවක් පමණක් නොව අතීතයේ කිසියම් කාල පරිච්ඡේදයක් තුළ ලාංකේය මානවයා විසින් රැස් කරගත් ද්‍රව්‍යමය දැනුම් සම්භාරයක එකතුවකි. කොළඹ ජාතික කෞතුකාගාරය මඟින් අතීත ලංකාවේ වාසය කළ මානවයාගේ ආර්ථික, සමාජ, ආගමික හා සංස්කෘතික ජන ජීවිතය පිළිබඳව විද්‍යමාන කරයි. ලංකාවේ අතීත හා වර්තමාන උරුමයන් ඒකරාශී කොට අනාගතය උදෙසා දායාද කරන ආයතනයක් ලෙස මෙය වැදගත් වේ.කොළඹ ජාතික කෞතුකාගාරය මඟින් ඉහත දී සඳහන් කළ පරිදි කෞතුකාගාරයකින් ඉටුකරන කාර්යයභාර්ය කොතෙක් දුරට සාධනය වන්නේ ද යන්න හා එහි තැන්පත් කර තිබෙන කෞතුක භාණ්ඩ මඟින් සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් තොරතුරු කොතරම් දුරට සනාථ කර ගැනීමට හැකිවේ දැයි විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස කොළඹ ජාතික කෞතුකාගාරය තෝරා ගැනිණි.

මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රය භාවිතා කර සන්සන්දනාත්මකව අධ්‍යයනයක් සිදු කර ඇත. එහිදී ප්‍රාථමික මූලාශ්‍රය වන සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය පරිශීලනය කරන ලදී. මහාවංසය, දීපවංසය, වංසත්ථප්පකාසිනිය හා බෝධිවංසය ආදි ලිඛිත සාහිත්‍ය මූලාශ්‍රයත් කෞතුකාගාරය තුළ තැන්පත් කර තිබෙන ඇතැම් අභිලේඛන, චිත්‍ර, මූර්ති ආදි පුරාවිද්‍යා මූලාශ්‍රයත් ප්‍රාථමික මූලාශ්‍රය ලෙස යොදා ගෙන ඇත. ද්විතීක මූලාශ්‍රය රැසක් ද මෙහිදී උපයෝගී කර ගන්නා ලදී.මෙම පර්යේෂණය මඟින් කොළඹ ජාතික කෞතුකාගාරය මෙරට විද්‍යාර්ථීන්ට පර්යේෂකයන්ට හා විවිධ වයස් සීමාවල මහජනයාට දැනුම ලබා ගැනීමේ විද්‍යායතනයක් ලෙසත් කෞතුක භාණ්ඩ නරඹා ඒවා ආස්වාදනය කරමින් මානසික තෘප්තිය ළඟා කර ගත හැකි ආයතනයක් ලෙසත් වැදගත් වන බව නිගමනය කළ හැකිය. එමෙන්ම සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් තොරතුරු සනාථ කිරීමේ දී ජාතික කෞතුකාගාරය විශාල දායකත්වයක් සපයයි. නමුත් අදීන නිභඬ යටගියාවක අනභිභවනීය වූද අභිමානනීය වූද සංස්කෘතික හරපද්ධතීන් සම්පිණ්ඩනය කර ඉදිරිපත් කරන මෙම ආයතනය පිළිබඳව ජනතාව මනා දැනුවත්භාවයකින් සමන්විත නොවන බව පෙන්නුම් කෙරේ. කෞතුකාගාරයේ තව දුරටත් ප්‍රවර්ධනය විය යුතු අංශ ගණනාවක් තිබීම ඊට හේතුව වේ.

**ප්‍රමුඛ පදඃ කෞතුකාගාර , කෞතුක භාණ්ඩ , අධ්‍යාපනය , ආස්වාදය**

[1] ***ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය; llakjayathissa@gmail.com***

[2] ***ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය,කැලණිය විශ්වවිද්‍යාලය***